**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 මතය**

-----

**මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයනලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.**

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

------------------------------------------

**1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

--------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 3 අනුව ඉදිරිපත් කර තිබුණු ආදායම් ප්‍රකාශය නියමිත ප්‍රමිතයට අනුව සකස් කර ඉදිරිපත් කර නොතිබිණ.

(ආ) 2009 වර්ෂයේදී ස්ථාවර වත්කම් ක්ෂය කිරීම් ප්‍රතිපත්තිය වෙනස් කර තිබුණද ප්‍රමිත අංක 10 ප්‍රකාරව ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ නව ප්‍රතිපත්තිය අනුව පෙර වර්ෂවලට අදාල ගැලපීම් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 හා 42 අනුව " අනාගත විශ්‍රාම ප්‍රතිලාභ " වෙනුවෙන් පමාණවත් වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි අඛන්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය හෙළිදරව් කර නොතිබුණි.

### 1.2.2 නීති, රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති සඳහා යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත | |
| (i) 20 වගන්තිය | විධිවිධාන ප්‍රකාර නිල වශයෙන් පත්වන සාමාජිකයින් 06 ක් හා නම් කළ සාමාජිකයින් 06 ක් වශයෙන් උපදේශක කාරක සභාව 12 දෙනෙකුගෙන් සමන්විත යුතු වුවත්, 2010 වර්ෂය සඳහා සාමාජිකයින් 10 ක් පමණක් පත්කර තිබුණි. |
| (ii) 26 වගන්තිය | සාමාජික මුදල් ගෙවීමට අපොහොසත්වීම මත සාමාජිකත්වය අහිමිවූ දායකයින් වෙත, පනතෙහි විධිවිධාන ප්‍රකාරව, දායකත්වය අහිමි වීම පිළිබඳව දැනුම් දීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය පරිච්ඡේදය 9 - 7 වන ඡේදය | භාණ්ඩාගාරයේ විධිමත් අනුමැතිය ලබාගැනීමකින් තොරව ඇතැම් නිලධාරීන් වෙත එකතුව රු.293,724 ක් වූ විශේෂ දීමනා ගෙවා තිබිණ. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ යෝජනා ක්‍රමයේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.37,889,972 ක අතිරික්තයක් වූ අතර, එයට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.63,772,073 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.25,882,101 ක් හෙවත් 40.58% ක අඩුවීමක් දක්නට ලැබිණි.

| | දෙසැම්බර් 31 අවසන් වසර | | විචලනය |
|---|---|---|---|
| | 2010 | 2009 | |
| | රු. | රු. | % |
| අරමුදලේ මුළු ආදායම | 62,547,149 | 85,047,690 | (26.46) |
| මුළු වියදම | 25,464,243 | 22,067,706 | 15.39 |
| වියදම ඉක්ම වුණ ආදායම | 37,082,906 | 62,979,984 | (41.12) |
| පරිපාලන ආදායම් අතිරික්තය | 807,066 | 792,089 | 1.89 |
| වර්ෂය සඳහා සමස්ථ අතිරික්තය | 37,889,972 | 63,772,073 | (40.58) |

### 2.1.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ විශ්ලේෂණාත්මක සමාලෝචනය

පහත සඳහන් පරිදි සමාලෝචිත වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප් අරමුදල් යෝජනා ක්‍රමයේ ශේෂය රු.මිලියන 243.6 කින් හෙවත් 44.7% කින් අඩුවීමක් පෙර වසර හා සැසඳීමේදී දක්නට ලැබිණ.

| වර්ෂය | අරමුදලේ ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 2009 | 542.7 |
| 2010 | 299.1 |
| අඩුවීම | 243.6 |

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

### 2.2.1 කාර්යසාධනය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී අරමුදලට දායකයින් බඳවා ගැනම සඳහා මණ්ඩලය විසින් කිසිදු පෙළඹවීම් වැඩසටහන් නිර්මාණය කර නොතිබිණ.

(ආ) සමාලෝචිත වර්ෂයේදී දායක කර ගැනිම ඉලක්ක කළ සංඛ්‍යාව 2000 ක් වුවත් බඳවාගන්නා ලද තත්‍ය දායකයින් සංඛ්‍යාව 1,539 ක් වූ බැවින්, ඉලක්කගත සංඛ්‍යාවෙන් 77% ක් පමණක් ඉටුකරගෙන තිබුණි. දිස්ත්‍රික් තුනකත් කිසිදු දායකයකු බඳවාගෙන නොමැති බවටත් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී බඳවාගැනීමට අදාල යොජනා ක්‍රමයේ මූල්‍ය ඉලක්කය රු.2,073,000 ක් වූ නමුත් තථ්‍ය දායකත්වය රු.6,829,603 ක් විය. යාපනය, මන්නාරම සහ මඩකලපුව යන දිස්ත්‍රික්කයන්ගෙන් බඳවාගත් තථ්‍ය දායකයින් ප්‍රමාණය හේතුවෙන් මූල්‍ය ප්‍රගතිය විශාල ලෙස ඉහල යාමට හේතුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී අනුමත ඉලක්කය අනුව දෙවන හා පසු වාරික වශයෙන් දායකයන් 37,000 දෙනෙකුගෙන් රු.5,550,000 ක් එකතු කළයුතු නමුත් තථ්‍ය දායකයන් 14,237 ක ගෙන් රු.1,854,985 ක මුදලක් එකතු කර තිබුණි. ඒ අනුව සත්‍ය මූල්‍ය ප්‍රගතිය 33.42% සහ බඳවාගැනීම් ප්‍රගතිය 38.47% පමණක් වූ අතර දිස්ත්‍රික්ක 4 කින් කිසිදු වාරිකයක් එකතු කර නොතිබිණ.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී විශ්‍රාම වැටුප් ගෙවීම් වටිනාකම රු.22,164,352 ක් වූ අතර දායකත්ව එකතු මුදල එකතුකළ දායකත්වයෙන් රු.8,684,561 හෙවත් 39.18% ක් විය.

(ඊ) සමාලෝචිත වර්ෂය තුල ධිවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකත්වය අහිමි වූ මුළු දායක සංඛ්‍යාව හඳුනාගෙන එම දායකයින් නැවත යෝජනා ක්‍රමයට බඳවා ගැනීම සඳහා මණ්ඩලය කටයුතු කර නොතිබිණ.

(උ) ධිවර විශ්‍රාම වටුප් යෝජනා ක්‍රමයේ දායකත්වය අහිමි නොවූ දායකයින් හඳුනාගෙන එම දායකයින්ගෙන් හිඟ වාර මුදල් අයකර ගැනිම මණ්ඩලය කටයුතු කර නොතිබිණ.

### 2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.

---

ආයෝජන පොලී වශයෙන් රු.5,411,930 ක් ලැබීම ප්‍රමාදවීම සම්බන්ධයෙන් බැංකුවකට එරෙහිව පවරා ඇති නඩුවක් සම්බන්ධයෙන් 1996 වර්ෂයේ සිට ආයතනය විසින් රු.1,075,875 ක වියදමක් දරා තිබිණ. එම නඩුව සම්බන්ධයෙන් මණ්ඩලයට වාසිදායක වන පරිදි 2003 දෙසැම්බර් 10 දින අධිකරණය විසින් තීන්දුවක් ලබාදී තිබුණි. නමුත් බැංකුව විසින් ඒ සම්බන්ධයෙන් නැවත අභියාචනාවක් කර ඇත. නඩුව සම්බන්ධයෙන් ප්‍රගතිය වාර්තා නොවුණි.

3. **පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර මණ්ඩලයේ අවධානය සඳහා යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව අවධානය යොමු කළයුතුවේ.

(අ) අරමුණු ක්‍රියාත්මක කිරීම
(ආ) ධීවරයින් සඳහා ප්‍රතිපාදන ගෙවීම්
(ඇ) ලැබිය යුතු මුදල්
(ඈ) දෙවන සහ පසු වාරික අයකිරීම්
(ඉ) උපදේශක කාරක සභා ක්‍රියාකාරිත්වය